# ACCOUNTING EQUATION (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# මූලික ගිණුම්කරණ සමීකරණයේ ඇතුළත් සංරචක

## වත්කම්

අතීත සිදුවීමක ප්‍රථිපලයක් මත බිහි වී ඇති අනාගත ආර්ථික ප්‍රථිලාභ ගලා එන ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කම ලෙස හැඳින්වේ.

## වගකීම්

අතීත ගනුදෙනුවක ප්‍රථිපලයක් මත බිහි වී ඇති, නිරාකරණය කිරීමේ දී සම්පත් පිටතට ගලා යන, වර්තමාන බැඳීම වගකීම් ලෙස හැඳින්වේ.

## හිමිකම්

ව්‍යාපාරයක් සතු වත්කම්වලින් ව්‍යාපාරයේ අයිතිකරුවන් කෙරෙහි අයිති කොටස හිමිකම් ලෙස හැඳින්වේ.

ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් වලින් මුදලින් අගය කළ හැකි ගනුදෙනු පමණක් ගිණුම්ගත කරයි.

ClassWork.LK

# ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන් හේතුවෙන් වත්කම්, වගකීම් හා හිමිකම්වලට ඇති කරන ද්විත්ව බලපෑම

ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන් හේතුවෙන් වත්කම්, වගකීම් හා හිමිකම්වලට ඇති කරන ද්විත්ව බලපෑම පහත අයුරින් සාරාංශ කළ හැකිය.

| ගනුදෙනු අංකය | හිමිකම් | + වගකීම් | = වත්කම් | ද්විත්ව ප්‍රථිපලය |
|---|---|---|---|---|
| 1. | | | = - + | එක් වත්කමක් අඩු වී, වෙනත් වත්කම් වැඩි වීම |
| 2. | | + | = + | වත්කමක් වැඩි වී වගකීම් වැඩි වීම |
| 3. | | - | = - | වත්කමක් අඩු වී වගකීම් අඩු වීම |
| 4. | + | | = + | වත්කමක් වැඩි වී හිමිකම් වැඩි වීම |
| 5. | - | | = - | වත්කමක් අඩු වී හිමිකම් අඩු වීම |
| 6. | + | - | = | වගකීම් අඩු වී හිමිකම් වැඩි වීම |
| 7. | - | + | = | වගකීම් වැඩි වී හිමිකම් අඩු වීම |

ClassWork.LK

## අභ්‍යාස

1. පහත සඳහන් ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ හිමිකමට බලපාන **ගනුදෙනු** පමණක් ඇතුලත් පිලිතුර තෝරන්න.

(i) අශාන් මුදලින් රු 1,500 000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම.

(ii) අශාන්ට පිය උරුමයෙන් ලද රු 1000 000 ක් වටිනා ගොඩනැගිල්ලක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යෙදවීම.

(iii) ව්‍යාපාරයේ කටයුතු සඳහා රු 800 000 කට මොටර් රථයක් මිල දී ගැනීම.

(iv) ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු 100 000 ක උපකරණ කමල්ගෙන් ණය ගැනීම.

(v) නැවත විකිණීම සඳහා රු 40 000 ක බඩු තොග අත්පිට මුදලට ගැනීම.

2. පහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකම හා වත්කම අඩුවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

(i) බැංකුවෙන් රු 200 000 ක ණයක් ගැනීම.

(ii) රු 50 000 ක තොගයක් අත්පිට මුදලට ගැනීම.

(iii) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු 10 000 කි.

(iv) බැංකුවෙන් ගත් ණය මුදලින් රු 30 000 ක් ගෙවීම.

(v) රු 40 000 ක භාණ්ඩ ණයට ගැනීම.

ClassWork.LK

**3**. පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකක් හැර අනෙක් ඒවා නිවැරදි වේ. වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) අයිතිකරුවන් හැර වෙනත් පාර්ශ්වයන් බාහිර පාර්ශ්වය ව්‍යාපාර සම්පත් සඳහා දායක වී නොමැති විට ගිණුම්කරණ සමීකරණය වත්කම් = හිමිකම් වේ.

(ii) ව්‍යාපාරයකට, එහි අයිතිකරුගෙන් හා ඔහුට අයත් වෙනත් ව්‍යාපාරවලිනුත්, වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇත.

(iii) මූල්‍ය මිනුම් සංකල්පයෙන් අදහස් වන්නේ මුදලින් අගය කළ හැකි සම්පත් පමණක් වාර්තාකරණ බවයි.

(iv) ව්‍යාපාරයක වත්කම් වෙනස්වන විට හිමිකම් අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවේ.

(v) ව්‍යාපාරයක වගකීම් වෙනස්වීම්, වත්කම්වලින් මෙන් ම හිමිකමේ බලපෑමෙනුත් සිදු වේ.

4. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (✓) ලකුණද අසත්‍ය නම් (x) ලකුණ ද යොදන්න.

(i) ව්‍යාපාර ඒකක සංකල්පය ගිණුම් තැබීමේ දී අදාළ කර ගත යුතුයි. (...)

(ii) ව්‍යාපාරයක් මගින් අයිතිකරුගේ පෞද්ගලික ණය ගෙවිය යුතුය. (...)

(iii) වත්කම් වෙනස් වන්නේ හිමිකමේ හෝ වගකීම්වල බලපෑමෙන් පමණි. (...)

(iv) අයිතිකරුට මූලිකව යොදවන ප්‍රාග්ධනයට අමතරව පසුව ප්‍රාග්ධනය යෙදිය නොහැකිය. (...)

(v) අයිතිකරුවෙකුට ව්‍යාපාර කීපයක් ඇති විට එම සියල්ල ම එකම ව්‍යාපාරයක් ලෙස සලකා ගිණුම් තැබීම සුදුසු ය. (...)

ClassWork.LK

(5) ජානිත්‍ය 2017 ජනවාරි 01 දින ව්‍යාපාරයක් ඇරඹීමට යෙදූ වත්කම් හා පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනුවල ද්විත්ව බලපෑම සමීකරණයක ස්වරූපයෙන් පහත දැක්වේ.

(රු. 000)

| | | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|---|
| (i) | ඉඩම් ගොඩනැගිලි | + 5 000<br>+ 2 000<br>+ 1 000 | = | 8 000 | + | - |
| (ii) | මුදල්<br>බඩු තොග | - 500<br>+ 500 | = | | + | |
| (iii) | කාර්යාල උපකරණ<br>මුදල් | + 300<br>- 300 | = | | + | |
| (iv) | මුදල් | - 800 | = | | | +800<br>බැංකුණය |
| (v) | මුදල් | - 200 | = | - 200 (හිමිකම) | + | |

ClassWork.LK

අවශ්‍ය වන්නේ :

1. ඉහත එක් එක් ගනුදෙනුව වටිනාකම් සහිත ව විස්තර කිරීම.

2. පළමු සතිය අවසානයේ මුළු වත්කම් මුළු වගකීම් හා මුළු හිමිකම් එකතු කර දැක්වීම.

6. තුෂාන්ගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි 01 දිනට ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | (රු. 000) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 4,000 |
| බස්රථය | රු. 2,000 |
| මුදල් | රු. 500 |
| බැංකු ණය | රු. 1,500 |

ජනවාරි මාසයේ පළමු පතියේ ගනුදෙනු පහත දැක්වේ (000)

1. රු. 50ක මුදල් ගෙවා භාණ්ඩ තොගයක් ගැනීම.
2. බැංකු ණයෙන් කොටසක් පියවීමට රු. 500 ක් දුන්නා.
3. රු. 250 ක බඩු තොගයක් චතුරගෙන් ණයට ගත්තා.
4. භාණ්ඩවල සත්තම වෙනස්වීම නිසා රු. 25 ක තොග චතුරට ආපසු යැවුවා.
5. තුෂාන් පුද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල රු. 50.

අවශ්‍ය වන්නේ :

1. වත්කම් = හිමිකම් + වගකීම් සමීකරණයේ ඉහත ගනුදෙනු වටිනාකම සමග දැක්වීම.
2. ගනුදෙනු අවසානයේ මුළු හිමිකම, මුළු වත්කම් හා මුළු වගකීම් ගණනය කර දැක්වීම.

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura